කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2021

2023 - ඔක්තෝබර්

**BCOME 1055 – ව්‍යාපාර හා කාර්මික නීතිය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 08 කාලය : පැය 03 යි

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. 1 කොටස (ප්‍රශ්න අංක 01) අනිවාර්ය වේ. ඔබ 2 කොටසින් ප්‍රශ්න 3ක් සහ 3 කොටසින් එක් ප්‍රශ්නයක් තෝරාගත යුතුය. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහයි (05).

---

**1 කොටස**

**ප්‍රශ්ණ අංක 01**

වඩාත් නිවැරදි පිළිතුර තෝරා දී ඇති පිළිතුරු සටහන් කර පොතේ ලියන්න.

1. නීතිය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

   අ) නීතිය යනු පරමාධිපත්‍යයේ අණයි

   ආ) යුක්තිය පසිඳලීම සඳහා රාජ්‍යයක් විසින් පිළිගෙන ක්‍රියාත්මක කරන ලද මූලධර්ම පද්ධතියකි

   ඇ) මිනිසුන්ගේ හැසිරීම නියාමනය කිරීම සඳහා රාජ්‍යයක් විසින් හඳුන්වා දෙන ලද නීති රීති පද්ධතියකි

   ඉ) ඉහත ප්‍රකාශ සියල්ල නිවැරදිය

2. පහත සඳහන් ඒවා අතුරින් , "ව්‍යාපාර නීතියේ" උප ශාඛාවක් වන්නේ,

   අ) දිළික්ත නීතිය

   ආ) නියෝජ්‍යත්ව නීතිය

   ඇ) කාර්මික නීතිය

   ඇ) දේපල නීතිය

3. වලංගු අර්පනයක් සඳහා නීත්‍යානුකූල අවශ්‍යතාවයක් නොවන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

අ) අර්පනය ඉදිරිපත් කරන්නාගේ කැමැත්ත ලබා ගැනීමට යටත්ව ඉදිරිපත් කළ යුතුය

ආ) අර්පනය ගනුදෙනුව සඳහා ඉදිරිපත් කරන්නාගේ කැමැත්ත ප්‍රකාශ කළ යුතුය

ඇ) අර්පනය ඉදිරිපත් කරන්නාට සන්නිවේදනය කළ යුතුය

ඉ) අර්පනයක් නිශ්චිත පුද්ගලයෙකුට ඉදිරිපත් කළ යුතු අතර පොදු ජනයා වෙත ඉදිරිපත් කළ නොහැක

4. අමිල තම නිවස බන්දුට විකිණීමට යෝජනාවක් කරයි. එම යෝජනාව ඉදිරිපත් කර දින පහකට පසු අමිලගේ නිවස ගින්නෙන් විනාශ වේ. ගිවිසුමේ විෂය කරුණු විනාශ වීම සම්බන්ධයෙන් අමිලගේ වගකීම;

අ) අවසානයට පැමිණේ

ආ) බන්දුට අදාළ යෝජනාව පිළිගත හැකිය හෝ නොගත හැකිය

ඇ) නව යෝජනාවක් සාදනු ලැබේ

ඈ) තවමත් වලංගුයි

5. B තම සුඛෝපභෝගී මෝටර් රථය A වෙත රුපියල් මිලියන 30 කට විකුණුවේ නැත්නම් B මරා දමන බවට A තර්ජනය කරයි. මෙහිදී B ගේ කැමැත්ත ලබාගෙන ඇත්තේ

අ) තර්ජනයෙන්

ආ) වංචාවෙන්

ඇ) වැරදීමකින්

ඈ) අනිසි බලපෑමෙන්

6. "නියෝජ්‍යත්ව නීතිය" ශ්‍රී ලංකාවට අදාළ කිරීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ;

අ) නියෝජ්‍යත්වය පිළිබඳ ඉංග්‍රීසි නීතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වේ

ආ) ඉංග්‍රීසි නීතිය ලංකාවට හඳුන්වාදීම සඳහා 1852 අංක 05 දරන ආඥාපනත මගින් නියෝජ්‍යත්වය නීතිය ලංකාවට හඳුන්වා දෙන ලදී.

ඇ) නියෝජ්‍යත්ව නීතියේ මූලධර්ම අඩංගු දේශීය නීති නොමැත

ඈ) මෙහි සඳහන් සියල්ල නිවැරදි ය

7. " ආදේශනය " මූලධර්මය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න

අ) ලබා ගත හැකි උපරිම වන්දි මුදල රක්ෂිත දේපලෙහි වටිනාකම වේ

ආ) මෙම මූලධර්මය සියලුම රක්ෂණ ගිවිසුම් සඳහා අදාළ වේ

ඇ) ඔහුට ප්‍රදානය කරනු ලබන්නේ රක්‍ෂිතයා පූර්ව අනතුරු තත්ත්වයට පත් කිරීම සඳහා සිදු වූ පාඩුවට සමාන මුදලක් පමණි.

ඈ) මෙහි සඳහන් සියල්ල නිවැරදි ය

8. හවුල් ව්‍යාපාරයක අත්‍යවශ්‍ය අංගයකි.

අ) ව්‍යාපාරයක්

ආ) ලාභ චේතනාව

ඇ) පොදුවේ ගනුදෙනු කිරීම

ඈ) මෙහි සඳහන් සියල්ල අවශ්‍ය වේ

9. පුද්ගලික සීමිත සමාගම් පිළිබඳ අසත්‍ය ප්‍රකාශය වන්නේ;

අ) අවම අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 01 කි

ආ) අධ්‍යක්ෂවරුන්ගේ උපරිම සීමාවක් නොමැත

ඇ) අවම කොටස් හිමියන් සංඛ්‍යාව 01 කි

ඈ) උපරිම සාමාජිකයින් සංඛ්‍යාව 100 කි

10. අනාගත භාණ්ඩ විකිණීම සඳහා ඇති කරන එකඟත්වයක් යනු;

අ) අවලංගු කළ හැකි ගිවිසුමක්

ආ) අවලංගු ගිවිසුමක්

ඇ) විකිණීමක්

ඈ) විකිණීමට එකඟ වේ

## 11 කොටස

**ප්‍රශ්ණ අංක 02**

අ) අපරාධ නීතිය සහ සිවිල් නීතිය අතර වෙනස්කම් හතරක් සඳහන් කරන්න.

(ලකුණු 04)

ආ) සුදුසු උදාහරණ සහිතව නීතියේ අරමුණු හතරක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ඇ) සිවිල් නීතියේ ශාඛා හතරක් නම් කරන්න

(ලකුණු 04)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 03**

අ) "වලංගු ගිවිසුමක්" ඇති කර ගැනීම සඳහා සපුරාලිය යුතු අත්‍යවශ්‍ය අංග මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) සුනිමල් ඔහුගේ BMW මෝටර් රථය නිමල්ට රුපියල් මිලියන 20 කට විකිණීමට අර්පනයක් ඉදිරිපත් කළේය. නිමල් එය රුපියල් මිලියන 19 කට මිලදී ගැනීමට එකඟ විය. සුනිමල් මෝටර් රථය මිලියන 19 කට විකිණීම ප්‍රතික්ෂේප කළේය. පසුව නිමල් මෝටර් රථය රුපියල් මිලියන 20 කට මිලදී ගැනීමට එකඟ විය. නමුත් සුනිමල් මෝටර් රථය එම මිලට නිමල්ට විකිණීම ප්‍රතික්ෂේප කළේය. ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් සුනිමල්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට නිමල් අදහස් කරයි. තීරණය කරන ලද නඩු තීන්දු ඇසුරින් නිමල්ට උපදෙස් දෙන්න.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 04**

අ) "අපරානුමැතිය මත නියෝජ්‍යත්වය" සිදුවීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි මොනවාද?

(ලකුණු 14)

ආ) තුන්වන පාර්ශවයක් සමඟ නියෝජිතයෙකු විසින් ඇති කරන ලද පහත ගිවිසුම්වල බලපෑම් පැහැදිලි කරන්න.

i) නියෝජිතයා ප්‍රධානියාගේ පැවැත්ම හෙළි නොකරන විට

ii) නියෝජිතයා ප්‍රධානියාගේ නම නොව පැවැත්ම පමණක් හෙළි කරන විට

iii) නියෝජිතයා ප්‍රධානියාගේ පැවැත්ම සහ නම හෙළි කරන විට

(ලකුණු 06)
(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 05

අ) ලියාපදිංචි සීමිත සමාගමක් සහ හවුල් ව්‍යාපාරයක් අතර ඇති ප්‍රධාන වෙනස්කම් මොනවාද

(ලකුණු 10)

ආ) 2007 අංක 07 දරන සමාගම් පනතට අදාළව පහත සඳහන් කරුණු පිළිබඳ කෙටි සටහන් ලියන්න.

I. සංස්ථාගත කිරීමේ සහතිකයක අන්තර්ගතය.

ii සමාගමක නම සහ අංකය භාවිතා කළ හැකි අවස්ථා ලැයිස්තුගත කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 06

අ) භාණ්ඩ විකිණීමේ ගිවිසුමක් සඳහා අදාළ වන ව්‍යාංග කොන්දේසි සඳහන් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 12)

ආ) අතුල 2023 ජනවාරි 01 වැනි දින රන්මල් ගෘහභාණ්ඩ ආයතනයෙන් රුපියල් 250000/- ක් වටිනා මේසයක් සහ පුටු දහයක් මිලදී ගැනීමට එකඟත්වයකට එළඹුනි. අතුල පසුදින එම ගෘහ භාණ්ඩ රැගෙන යාමට එකඟ වූ අතර, 2023 ජනවාරි 21 වන දින එම ගෘහ භාණ්ඩ සඳහා ගෙවීමට ද ඔහු එකඟ විය. 2023 ජනවාරි 1 වන දින සවස ඇති වූ ගින්නකින් සමාගමේ සියලුම ගෘහ භාණ්ඩ විනාශ විය. අතුල අදාල ගෘහ භාණ්ඩ සඳහා මුදල් ගෙවිය යුතු ද? හේතු දක්වන්න

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

**111** කොටස

ප්‍රශ්ණ අංක 07

අ) ස්වාධීන ගිවිසුම්කරුවෙකුගෙන් සේවකයෙකු වෙන්කර හඳුනා ගැනීම සඳහා අධිකරණය විසින් සකස් කරන ලද ප්‍රධාන පරීක්ෂණ මොනවාදැයි දක්වා පැහැදිලි කරන්න

(ලකුණු 10)

ආ) ශ්‍රී ලංකාවේ ආයතන වල සේවයේ නියුක්ත විවිධාකාරයේ සේවකයන් නම් කොට විස්තර කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 08

අ) සේවකයින්ගේ සේවා කොන්දේසි සහ නියමයන් නියාමනය කිරීම සඳහා සාප්පු සහ කාර්යාල සේවක පනත මගින් සපයා ඇති විවිධ ව්‍යවස්ථාපිත විධිවිධාන නම් කර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) කාර්මික ආරවුල් විසඳීම සඳහා කාර්මික ආරවුල් පනතේ අඩංගු විකල්ප ක්‍රම කෙටියෙන් පැහැදිලි කරන්න

(ලකුණු 10)

(මුළු ලකුණු 20)